## 6. ශීර්ෂය 4 - උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු

### 6.1 ලේඛන පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතුම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |
| විගණන විමසුම් ලේඛනය | මුදල් රෙගුලාසි 452 (1) | පවත්වා නොතිබුණි |
| සුළු මුදල් පොත | මුදල් රෙගුලාසි 446 | පවත්වා නොතිබුණි |
| චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය | මුදල් රෙගුලාසි 451 | පවත්වා නොතිබුණි |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි |
| විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) | පවත්වා නොතිබුණි |
| බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි |
| ඉන්ධන ලිහිසි තෙල් ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඇ) | පවත්වා නොතිබුණි |
| වාහන ලැයිස්තුගත කිරීම් ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) | පවත්වා නොතිබුණි |
| පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| රාජකාරි දුරකතන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) | යාවත්කාලීන කර නොතිබුණි. |

### 6.2 විසර්ජන ගිණුම

#### අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.3,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 10 ක් සඳහා රු.177,755,701 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 ත් සියයට 97 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව 2010 වර්ෂයේදී නිලධාරියෙකු වෙත රු.250,000 ක සීමාව ඉක්මවා ආපදා ණය ගෙවා තිබුණි.

## 6.4 යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය

### 6.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 6.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 6.4.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

### 6.4.4 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබුණි.

## 6.5 වත්කම් කළමනාකරණය

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එම වාර්තා 2015 ජුනි 11 දින ඉදිරිපත් කර තිබුණි.

## 6.6 කාර්යසාධනය

2014 වර්ෂයේ අධිකරණ අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තා අනුව උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පහත පරිදි වේ.

### (අ) ශ්‍රේෂ්ඨාධිකරණයේ කාර්යසාධනය

| නඩු වර්ගය | 2014 ජනවාරි 01 දිනට විසඳීමට තිබුණු නඩු සංඛ්‍යාව | 2014 වර්ෂය තුල ලියාපදිංචිවූ නඩු සංඛ්‍යාව | 2014 වර්ෂයේදී විසඳීමට තිබුණු මුළු නඩු සංඛ්‍යාව | 2014 වර්ෂයේදී ඉල්ලීමට ඉඩ ලබාදුන් නඩු සංඛ්‍යාව | 2014 වර්ෂයේදී අවසන් කළ නඩු සංඛ්‍යාව | 2014 දෙසැම්බර් 31 දිනට විසඳීමට තිබුණු ඉතිරි නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| මූලික අයිතිවාසිකම් ඉල්ලුම් පත්‍ර | 817 | 369 | 1186 | - | 448 | 738 |
| විශේෂ අවසර ඉල්ලුම් පත්‍ර | 379 | 261 | 640 | 74 | 230 | 336 |
| පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝග | - | 05 | 05 | - | 05 | - |
| අභියාචනා නඩු | 368 | 199 | 567 | - | 211 | 356 |
| වාණිජ මහාධිකරණ අභියාචනා නඩු මහාධිකරණ අවසර | 257 | 88 | 345 | - | 121 | 224 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඉල්ලුම් පත් | 153 | 80 | 233 | 13 | 74 | 146 |
| රිට් ඉල්ලුම් පත්‍ර | 01 | 02 | 03 | - | 01 | 02 |
| පළාත්බද මහාධිකරණ අභියාචනා නඩු | 1103 | 686 | 1789 | 155 | 458 | 1176 |
| ප්‍රතිශෝධන නඩු | - | 07 | 07 | - | 02 | 05 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථ නිරූපනය සම්බන්ධ නඩු | 01 | - | 01 | - | - | 01 |
| විවිධ නඩු | 06 | 04 | 10 | - | 01 | 09 |
| SC TAB APPEL | 01 | 01 | 02 | - | 02 | - |
| SC SPECIAL | 07 | 08 | 15 | - | 02 | 13 |
| **එකතුව** | **3,093** | **1,710** | **4,803** | **242** | **1,555** | **3,006** |

ඉහත තොරතුරු අනුව 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රේෂ්ඨාධිකරණයේ විසඳීමට තිබුණු මුළු නඩු සංඛ්‍යාව 3,006 ක් විය.

(ආ) **අභියාචනාධිකරණයේ කාර්යසාධනය**

අභියාචනාධිකරණයේ විසඳීමට තිබුණු නඩු පිළිබඳ කාර්යසාධනය පහත දැක්වේ.

| නඩු වර්ගය | 2014 ජනවාරි 01 දිනට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව | 2014 වර්ෂය තුළ ලියාපදිංචි වූ නඩු සංඛ්‍යාව | 2014 වර්ෂයේදී තීරණය න් ලබා දී තිබුණු නඩු සංඛ්‍යාව | 2014 දෙසැම්බර් 31 දිනට විසඳීමට තිබුණු ඉතිරි නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| රිට් අයදුම්පත් | 1,135 | 416 | 348 | 1,203 |
| මහාධිකරණ අභියාචනා | 817 | 283 | 243 | 857 |
| පළාත් බද මහාධිකරණ අභියාචනා | 1,224 | 200 | 307 | 1,117 |
| සිවිල් අභියාචනා | 1,379 | - | 398 | 981 |
| පළාත් බද මහාධිකරණ ප්‍රතිශෝධන අයදුම්පත් | 285 | 156 | 159 | 282 |
| ප්‍රතිශෝධන ( සිවිල් ) සහ අභියාචනයට අවසර අයදුම්පත් | 113 | 20 | 49 | 84 |
| වෙනත් අයදුම්පත් | 82 | 90 | 33 | 139 |
| එකතුව | 5,035 | 1,165 | 1,537 | 4,663 |

ඉහත තොරතුරු අනුව 2014 දෙසැම්බර් 31 දිනට අභියාචනාධිකරණයේ විසඳීමට තිබුණු මුළු නඩු සංඛ්‍යාව 4,663 ක් විය.